NationsTrustBank

# නේෂන්ස් ව්‍යාපාර ආයෝජන සැලසුම් ගිණුම්
# නියමයන් හා කොන්දේසි

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී -පීකිවු 118 (මෙහි මින්මතු "බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන ) විවෘතකර පවත්වා ගෙන යනු ලබන නේෂන්ස් ව්‍යාපාර ආයෝජන සැලසුම් ගිණුම් (මෙහි මින්මතු "NBIP ගිණුම්" ලෙසින් හඳුන්වනු ලබන) පහත සඳහන් නියමයන් සහ කොන්දේසි මඟින් පාලනය වනු ඇත.

## ගිණුම් විවෘත කිරීම

1. බැංකුව මඟින් පිළිගනු ලබන සම්මත අනන්‍යතා තහවුරු කිරීමේ ක්‍රියාවලියක් මඟින් සිදුකරනු ලබන ධනාත්මක හඳුනාගැනීමක් මත හා බැංකුවේ ගිණුම් විවෘත කිරීමේ ලියකියවිලි සම්පූර්ණ කිරීමෙන් පසු සහ ගිණුම් විවෘත කිරීම සඳහා අවශ්‍ය සියලුම ලියකියවිලි සැපයීම මත වයස අවුරුදු 18 ට වැඩි ඕනෑම පුද්ගලයෙකු විසින්, සමාගමක් විසින් හෝ ව්‍යාපාර ආයතනයක හවුල්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් විසින් හෝ වෙනත් ආකාරයකින් බැංකුව විසින් අනුමත කරන පරිදි (මින්මතු ගනුදෙනුකරු ලෙස හැඳින්වෙන) NBIP ගිණුමක් විවෘත කළ හැකිය.

2. NBIP ගිණුම ආරම්භ කිරීමට සමගාමීව සහ ගනුදෙනුකරුට බැංකුවේ ජංගම ගිණුමක් නොමැති නම්, බැංකුවේ සම්මත ජංගම ගිණුම් විවෘත කිරීමේ ක්‍රියා පටිපාටිවලට අනුකූලව ගනුදෙනුකරු විසින් බැංකුවේ ජංගම ගිණුමක් (මින්මතු ජංගම ගිණුම ලෙස හැඳින්වෙන)විවෘත කරනු ලැබිය යුතු වේ.

3. රු. 10,000.00 අවම මූලික තැන්පතුවකින් හෝ බැංකුව විසින් එහි පරම අභිමතය පරිදි කලින් කලට තීරණය කළ හැකි වෙනත් මුදලක් මත NBIP ගිණුමක් ආරම්භ කරනු ලැබිය හැකිය.

4. මෙහි දැක්වෙන නියමයන් ප්‍රකාරව විවෘත කරන ලද සෑම ගිණුමකටම අංකයක් ලබා දෙනු ලබන අතර එය බැංකුව සමඟ කෙරෙන සියලුම ලිපි හුවමාරුවන්හි සහ සියලුම තැන්පතු පත්‍රිකාවල සඳහන් කළ යුතුය. ගණුදෙණුකරු වෙත දැනුම් දීමක් සහිතව එසේ ලබා දෙන අංකය වෙනස් කිරීමට බැංකුවට අයිතිය ඇත.

## කල්පිරීමේ ඉලක්කගත මුදල් ප්‍රමාණය හා කල්පිරීමේ දිය

5. රු.250,000.00 ක අවම කල්පිරීමේ ඉලක්කගත මුදලකින් සහ රු. 5,000,000.00 ක උපරිම කල් පිරීමේ ඉලක්කගත මුදලකින් NBIP ගිණුමක් ආරම්භ කළ හැකිය. "කල්පිරීමේ ඉලක්කගත මුදල" යනු බැංකුවේ නියමයන් සහ කොන්දේසිවලට යටත්ව නේෂන්ස් ව්‍යාපාර ආයෝජන සැලසුම (මින්මතු "ආයෝජන සැලසුම" ලෙස හැඳින්වෙන") යටතේ කල්පිරීමේ දිනට ලබාගැනීම සඳහා ගනුදෙනුකරු බැංකුව සමඟ ගිවිසුම්ගත වන මුදලයි."කල්පිරීමේ දිනය" යනු බැංකුවේ නියමයන් සහ කොන්දේසිවලට යටත්ව ආයෝජන සැලසුම යටතේ කල්පිරීමේ ඉලක්කගත මුදල ගනුදෙනුකරුට ලැබෙන දිනයයි.

6. කල්පිරීමේ ඉලක්කගත මුදල, වසර 02 ක අවම කාලසීමාවකින් සහ වසර 05 ක උපරිම කාලසීමාවකින් හෝ කලින් කලට බැංකුව විසින් නියම කර අවසර ලබා දිය හැකි වෙනත් කාලසීමාවකින් ලබාගැනීමට ගනුදෙනුකරුට තෝරාගත හැකිය.

7. ගනුදෙනුකරු විසින් එන්බීඅයිපී ගිණුම විවෘත කරන අවස්ථාවේදී ආයෝජන සැලැස්ම යටතේ කල්පිරීමේ ඉලක්කගත වටිනාකම ලබාගැනීමට ගනුදෙනුකරු අපේක්ෂා කරන කල්පිරීමේ ඉලක්කගත මුදල හා කල්පිරීමේ දිනය NBIP ගිණුම් විවෘත කිරීමේ පත්‍රිකාවේ දැක්වීමෙන් තෝරාගත යුතුය.. ඒ අනුව ගනුදෙනුකරු විසින් තෝරාගනු ලැබූ කල්පිරීමේ ඉලක්කගත මුදල කල්පිරීමේ දින ලබාගැනීමට සුදුසුකම් ලැබීම පිණිස බැංකුව විසින්, NBIP ගිණුම විවෘත

කරන අවස්ථාවේ ගනුදෙනුකරුහට බැංකුවේ නියමයන් හා කොන්දේසිවලට යටත් ව NBIP ගිණුමේ තැන්පත් කළ යුතු මාසික වාරික මුදල සහ එකී වාරිකයට නියමිත දිනය පිළිබඳව ගණනය කර උපදෙස් ලබාදෙනු ඇත.

## වාරික

8.

අ. බැංකුව විසින් මූලික තැන්පතුව, ඉලක්කගත කල් පිරීමේ අගය, ආයෝජන කාල සීමාව සහ ගිවිසුම්ගත පොළී අනුපාතය සැලකිල්ලට ගැනීමෙන් මාසික වාරික මුදල ගණනය කරනු ලැබේ.කෙසේවුවද, මුල් මාසික වාරිකය රු.10,000.00 කට නොඅඩු වේ.

ආ. බැංකුව විසින් නිශ්චිතව දක්වා ඇති පරිදි නියමිත දින හෝ එයට පෙර මාසික වාරික මුදල NBIP ගිණුමෙහි තැන්පත් කිරීමට ගනුදෙනුකරු පොරොන්දු වන අතර එසේ කිරීමට එකඟවේ. ගනුදෙනුකරු විසින් තෝරාගනු ලැබූ කල් පිරීමේ ඉලක්කගත මුදල ලබා ගැනීමට සුදුසුකම් ලැබීම සඳහා සෑම මසකම නියමිත දිනට හෝ එයට පෙර මාසික වාරික මුදල සම්පූර්ණයෙන්ම කල්පිරීමේ දිනය දක්වා තැන්පත් කිරීම අනිවාර්ය වේ. සෑම මසකම නියමිත දිනට හෝ එයට පෙර මාසික වාරික මුදල සම්පූර්ණයෙන්ම තැන්පත් කිරීමට ගනුදෙනුකරු අසමත් වන්නේ නම් ගනුදෙනුකරුහට කල්පිරීමේ දිනට කල්පිරීමේ ඉලක්කගත මුදල ලබාගැනීමේ හැකියාවක් නොමැත.

9. පහත 10 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, ගනුදෙනුකරුගේ නමින් නිකුත් කරන ලද මුදල් සහ චෙක්පත් පමණක් NBIP ගිණුමට තැන්පතු ලෙස පිළිගනු ලැබේ, කෙසේ වුවද, වෙනත් බැංකුවලින් නිකුත් කරන ලද චෙක්පත් සම්බන්ධයෙන් වූ විටදී , චෙක්පත් උපලබ්ධි වී මුදල NBIP ගිණුම වෙත බැරවූ දිනයේදී පමණක් වාරික මුදල NBIP ගිණුමෙහි තැන්පත් කරන ලද බවට සැලකේ.

10. මෙහි දැක්වෙන පරිදි මාසික වාරික ගෙවීම සඳහා NBIP ගිණුම විවෘත කරන අවස්ථාවේදී ගනුදෙනුකරු විසින් NBIP ගිණුමට බැංකුවේ පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුමකින් ස්ථාවර උපදෙස් ලබා දිය යුතුය.

## පොළිය හා කල්පිරීම් මත ගෙවීම්

11. NBIP ගිණුම විවෘත කරන අවස්ථාවේදී බැංකුව විසින් නියම කරනු ලබන අනුපාතයට පොළිය NBIP ගිණුමෙහි දෛනික ශේෂය මත ගණනය කරනු ලබන අතර එය කල්පිරීමේ දින දක්වා මාසිකව NBIP ගිණුමට බැරකරනු ලැබේ. බැංකුවට සුදුසු යැයි හැඟෙ නම් පොළී අනුපාත වෙනස්කිරීමේ හෝ විචලනය කිරීමේ අයිතිය බැංකුව සතුය.

12. ඕනෑම අවස්ථාවකදී ආයෝජන සැලැස්ම යටතේ බැංකුව විසින් විශේෂිතව දක්වා ඇති මාසික වාරික මුදලට වඩා වැඩි ප්‍රමාණයක් හෝ එකී වාරිකයේ ගුණිතයන් ගනුදෙනුකරු විසින් තැන්පත් කරන විටෙකදී විශේෂිතව දක්වා ඇති මාසික වාරික මුදලට වැඩියෙන් ඇති මුදල සම්බන්ධයෙන් තම අභිමතය පරිදි අඩු පොළී අනුපාතිකයකට පොළිය ගණනය කිරීමට හෝ ගනුදෙනුකරු වෙත දැන්වීමක් ලබා දෙමින් එකී අතිරික්ත මුදල සම්බන්ධයෙන් පොළී මුදලක් නොගෙවා සිටීමේ අයිතිය බැංකුව සතුවේ.

13. බැංකුව විසින් ගනුදෙනුකරු වෙත කල්පිරීමේ දිනට හෝ නීතිය මඟින් අවශ්‍ය කරනු ලබන ආයෝජන කැලසීමාව තුළ ගෙවිය යුතු බදු සහ වෙනත් ව්‍යවස්ථාපිත අයබදු අඩුකරගනිමින්, මෙහි විධිවිධාන ප්‍රකාරව ගනුදෙනුකරු වෙත ලබා දී ඇති අයිරා පහසුකම යටතේ සියලුම හිඟ මුදල් සහ අනෙකුත් ගාස්තු (තිබේ නම්) ඒවා අඩු කරගනිමින් කල්පිරීමේ ඉලක්කගත මුදල ගෙවනු ලබනු ඇති අතර කෙසේවුවද, ගනුදෙනුකරු විසින් සියලු අවස්ථාවන්හිදී මෙහි දක්වා ඇති සියලු නියමයන් හා

කොන්දේසිවලට අනුකූල වී තිබිය යුතුය.

14. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටිනු ලබන පරිදි ගනුදෙනුකරු විසින් තම බදු තත්ත්වය සහ පදිංචි තත්ත්වය පිළිබඳව ව්‍යවස්ථාපිත ප්‍රකාශයක් ගිණුම් විවෘතකිරීමේ පත්‍රිකාවේ සම්පූර්ණ කළ යුතුය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හෝ එකී කාර්යය සඳහා නීතිය මගින් නියම කරනු ලැබ ඇති වෙනත් අධිකාරියක් මගින් නියම කරනු ලබන පරිදි පොලී ගෙවීම් මත ගෙවිය යුතු වන රැඳවුම් බද්ද හෝ වෙනත් යම් බදු මුදලක් බැංකුව මගින් අඩුකරගනු ඇත.අදාළ අධිකාරිය මගින් පසුව ඉල්ලා සිටිනු ලැබ තිබේ නම් නොගෙවූ බදු මුදල් ගනුදෙනුකරුට දැනුම් දීමකින් තොරව ඕනෑම අවස්ථාවක ගනුදෙනුකරුගෙන් අයකරගැනීමට බැංකුවට අයිතිය ඇත.

15. පහත 23 වගන්තියේ දක්වා ඇති පරිදි හැර , කල් ඉකුත්වීමේ දිනට පෙර NBIP ගිණුමෙන් මුදල් ආපසු ලබාගැනීමට ගනුදෙනුකරුට අවසර දෙනු නොලැබේ.

**අයිරා පහසුකම**

16. පහත 18 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, බැංකුව ගනුදෙනුකරු වෙත බැංකුව විසින් තීරණය කරනු ලබන පොලී අනුපාතයකට ජංගම ගිණුමේ රුපියල් 100,000.00 ක අවම සීමාවක් සඳහා සහ NBIP ගිණුමේ පවතින ශේෂයේ වටිනාකමින් 50% දක්වා බැංකුවේ නියමයන් සහ කොන්දේසි වලට යටත්ව අයිරා පහසුකමක් ("අයිරා පහසුකම") ගනුදෙනුකරුට ලබා දිය හැක. කෙසේවුවද, අයිරා පහසුකම සඳහා සුදුසුකම් ලැබීමට නම්, ගනුදෙනුකරුගේ NBIP ගිණුමේ රු. 200,000.00 ක අවම ශේෂයක් තිබිය යුතුය.

17. ඉහත කී පරිදි අයිරාව අධිකාරය ලද සීමාව ඉක්මවන අවස්ථාවකදී කල් පිරෙන දිනට පෙර ඕනෑම අවස්ථාවක NBIP ගිණුම ඇවර කිරීමේ අයිතිය බැංකුව සතුය.

18. ඉහත කී පරිදි අයිරා පහසුකම සැපයීම, NBIP ගිණුමේ ගිණුම් ශේෂය ගනුදෙනුකරු විසින් නිරවුල් නොකරන ලද වෙනත් බැංකු පහසුකමක් සඳහා සුරැකුමක් ලෙස සපයා නොතිබීමේ කොන්දේසියට යටත් වේ.

**<u>කල්පිරීමේ දිනය</u>**

19.

අ. තනි පුද්ගලයෙකු වූ ගනුදෙනුකරු මියගිය විටදී

ආ. බලපවත්නා නීතිය අනුව තනිපුද්ගල ව්‍යාපාරයක්, හවුල් ව්‍යාපාරයක්, හෝ සංවිධානයක් /සමිතියක් /සංගමයක් විසුරුවාහැරීමකදී හෝ

ඇ. ගණන් බේරා වසා දැමීම , ඇවරකිරීම හෝ වෙනත් ඕනෑම ආකාරයකින්(ආකාරවලින්) සමාගමට අදාළ වන නීතිය අනුව විසුරවාහැරීම කදී

කල් පිරීමේ දිනයට පෙර, ආයෝජන සැලැස්ම සහ අයිරා පහසුකම අවසන් වන අතර, ගනුදෙනුකරු මියයන හෝ විසුරුවා හරින (අවස්ථාවෝචිතව) දිනට අයිරා පහසුකම යටතේ ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු බදු සහ වෙනත් ව්‍යවස්ථාපිත අයබදු සහ සියලුම හිඟ මුදල් සහ අනෙකුත් ගාස්තු (ඇත්නම්) අඩුකරගනිමින් ආයෝජන සැලැස්ම යටතේ ආයෝජනය කළ ප්‍රධාන මුදල් සහ උපචිත පොළිය ඇතුළුව NBIP ගිණුමේ ශේෂය (අවසන් නිරවුල් වටිනාකම අනුව), අදාළ වන නීතියට අනුකූලව බැංකුව විසින් ගෙවනු ලැබේ.

20. තනිපුද්ගල ගනුදෙනුකරුවෙකු සම්බන්ධයෙන් වූ විටකදී, ඔහු විසින්, කල්පිරීමේ දිනට පෙර ගනුදෙනුකරු මියයන අවස්ථාවකදී අදාළ වන නීතීන් සහ බැංකුවේ කොන්දේසි හා නියමයන් ප්‍රකාරව NBIP ගිණුම විවෘත කරන අවස්ථාවේදී හෝ ඉන් අනතුරුව ඕනෑම අවස්ථාවකදී නාමයෝජනා පත්‍රිකාව සම්පූර්ණ කිරීමෙන් අවසන් නිරවුල් වටිනාකම ගෙවනු ලැබිය යුතු ප්‍රතිලාභියා (ප්‍රතිලාභීන්) නම්කළ හැකිය.

## <u>ගනුදෙනුකරු විසින් පැහැරහැරීමේ ප්‍රතිවිපාක</u>

21. නියමිත දිනට ඕනෑම වාරික 2ක් ගෙවීම ගනුදෙනුකරු පැහැරහැරීමෙන් අනතුරුව ඕනෑම අවස්ථාවකදී ගනුදෙනුකරුට දැනුම්දීමෙන් ආයෝජන සැලැස්ම අවසන් කිරීමේ අයිතිය බැංකුව සතු වන අතර 22, 24 වගන්තිවලට සහ බැංකුවේ සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසිවලට යටත්ව බැංකුව විසින් ;

අ) NBIP ගිණුම වසා දමා ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු බදු සහ ව්‍යවස්ථාපිත ගාස්තු හා ගිණුම වැසීමේ ගාස්තු අඩුකරමින් එවන් අවසන් කිරීමක් සිදුකරන කාලය තෙක් උපචිත වූ පොලිය සමගින් ආයෝජනය කර ලද මූලික මුදල ගනුදෙනුකරුට ගෙවීම

හෝ

ආ) NBIP ගිණුම වසා දමා ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු බදු සහ ව්‍යවස්ථාපිත ගාස්තු හා ගිණුම වැසීමේ ගාස්තු අඩුකරමින් එවන් අවසන් කිරීමක් සිදුකරන කාලය තෙක් උපචිත වූ පොලිය සමගින් ආයෝජනය කර ලද මූලික මුදලද ඇතුළුව NBIP ගිණුමේ ඇති ශේෂය, ගනුදෙනුකරුගේ නමින් විවෘත කරන ලද ව්‍යාපාර ජංගම ගිණුම් පාලනය කරන නියමයන් සහ කොන්දේසි වලට යටත් වන ව්‍යාපාරික ජංගම ගිණුමකට මාරු කිරීම

හෝ

ඇ) NBIP ගිණුම පවත්වාගෙන යාමට සහ ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු බදු සහ ව්‍යවස්ථාපිත ගාස්තු අඩුකරමින් කල්පිරීමේ දිනයේදී උපචිත වූ පොලිය සමඟින් ආයෝජනය කර ලද මූලික මුදල (කල් පිරීමේ ඉලක්ක මුදල නොවේ ) ගෙවීම මඟින් ගනුදෙනුකරුවන්ගේ ගිණුම් සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබිය හැකිය.

22. ඉහත 21 වැනි වගන්තියේ දක්වා ඇති ආකාරයට NBIP ගිණුම වසා දැමීමකදී හෝ ඉහත 21 උප වගන්තියේ ඇ) හි දක්වා ඇති පරිදි NBIP ගිණුමක් පවත්වාගෙන යාමේදී බැංකුව විසින් බැංකු නියමයන් සහ කොන්දේසිවලට යටත්ව, අයිරා පහසුකම අවසන් කළ යුතු අතර සහ අයිරා පහසුකම යටතේ ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු සියලුම බදු, ව්‍යවස්ථාපිත අයකිරීම් සහ හිඟ මුදල් සහ අනෙකුත් ගාස්තු (ඇත්නම්) අයකර ගැනීමට කටයුතු කරන අතර බැංකුව විසින් කරන ලද පළමු ඉල්ලීම මත ගනුදෙනුකරු විසින් එය ගෙවනු ලැබිය යුතුය.

23. සුවිශේෂී අවස්ථාවන්හිදී සහ බැංකුවේ පරම අභිමතය පරිදි හැර, NBIP ගිණුම වසා දැමීමට සහ/හෝ එහි ඇති ශේෂය සම්පූර්ණයෙන් හෝ කොටසක් වශයෙන් කල්පිරීමේ දිනට පෙර ආපසු ගැනීමට ගනුදෙනුකරුවන්ට අවසර නොලැබේ. කල්පිරීමේ දිනට පෙර NBIP ගිණුම වසා දැමීමට බැංකුව ගනුදෙනුකරුවාට අවසර දෙන අවස්ථාවකදී, බැංකුව විසින් බැංකුවේ නියමයන් සහ කොන්දේසිවලට

යටත්ව, අයිරා පහසුකම යටතේ ගනුදෙනුකරු විසින් ගෙවිය යුතු බදු, ව්‍යවස්ථාපිත අයකිරීම්, සියලුම හිඟ මුදල් සහ අනෙකුත් ගාස්තු (ඇත්නම්)සහ ගිණුම වැසීමේ ගාස්තු අඩුකරමින් අවසන් කරන කාලය දක්වා උපචිත පොලිය සමඟ ආයෝජනය කරන ලද මූලික මුදල ගනුදෙනුකරුට ගෙවිය යුතුය.

24. ඉහත 21 හෝ 23 වගන්ති යටතේ දක්වා ඇති ඕනෑම තත්වයක් යටතේ බැංකුව විසින් හෝ ගනුදෙනුකරු විසින් ආයෝජන සැලැස්මක් අවසන් කර NBIP ගිණුම වසා දැමුවහොත්, NBIP ගිණුම වසා දැමීමේදී NBIP ගිණුමේ ඇති මුළු උපචිත පොළියෙන් 50% ක දඩ මුදලක් බැංකුව විසින් අය කරනු ලැබෙන අතර එවැනි වසා දැමීමකදී  බැංකුව විසින් තම අභිමතය පරිදි තීරණය කරනු ලබන ගිවිසුම්ගත පොලී අනුපාතයට වඩා අඩු අනුපාතයකින් NBIP ගිණුමේ ආයෝජනය කර ඇති මූලික මුදල් සඳහා පොලී ගෙවීමටද බැංකුවට අයිතිය ඇත.

25. ගනුදෙනුකරුගේ අවසන් වරට දන්නා  ලිපිනය වෙත මාස 2කට පූර්වයෙන් ලිඛිතව දැනුම් දීමකින් පසු ඕනෑම අවස්ථාවක ආයෝජන සැලැස්ම අවසන් කිරීමට සහ ඕනෑම NBIP ගිණුමක් තම අභිමතය පරිදි වසා දැමීමට බැංකුවට අයිතිය ඇත. බැංකුව විසින් කල් පිරෙන දිනට පෙර ආයෝජන සැලැස්ම අවසන් කළහොත් සහ/හෝ  මෙම වගන්තිය යටතේ NBIP ගිණුම වසා  දැමුවහොත්  බැංකුව විසින් බැංකු නියමයන් සහ කොන්දේසි වලට යටත්ව, එම අවසන් කරන දිනය දක්වා උපචිත පොලිය සමඟ ආයෝජනය කරන ලද මූලික මුදල්, අයිරා පහසුකම යටතේ ගනුදෙනුක  විසින් ගෙවිය යුතු බදු, ව්‍යවස්ථාපිත අයකිරීම්, සියලුම හිඟ මුදල් සහ අනෙකුත් ගාස්තු (ඇත්නම්) අඩුකර ගනුදෙනුකරුට ගෙවිය යුතුය.

26. ගනුදෙනුකරු විසින් තෝරාගන්නා ලද එන්බීඅයිපී ගිණුමේ විස්තර සඳහන් කරන ආයෝජන පිළිබඳ දැන්වීමක් එන්බීඅයිපී ගිණුම ආරම්භ කර අවස්ථාවේදී ගනුදෙනුකරුට නිකුත් කරනු ඇත. ගනුදෙනුකරුට පාස්පොත් නිකුත් කරනු නොලැබේ.

27. NBIP ගිණුමේ ද්වි වාර්ෂික ගිණුම් ප්‍රකාශයක්ම බැංකුව මඟින් ගනුදෙනුකරුට ලබාදෙනු ඇත. කෙසේවුවද, ගනුදෙනුකරුට දැන්වීමක් ලබාදෙමින් තම අභිමතය පරිදි ගිණුම් ප්‍රකාශ ලබාදෙන වාර සංඛ්‍යාව වෙනස්කිරීමට බැංකුවට අයිතිය ඇත.

28. ප්‍රකාශය ලැබීමට නියමිත දින සිට දින 15 ක් (එනම් සෑම වසරකම ජුනි 30 වන දින සහ දෙසැම්බර් 31 වන දින) තුළ ගිණුම් ප්‍රකාශය ගනුදෙනුකරුට නොලැබුණි නම් බැංකුවට ඒ පිළිබඳව උපදෙස් ලබා දිය යුතුය. සටහන්වල නිරවද්‍යතාවය සහතික කිරීම සඳහා සෑම ගිණුම් ප්‍රකාශයක්ම පරීක්ෂා කිරීමට ගනුදෙනුකරු එකඟ වේ. යම් වරදක් තිබේ නම් ප්‍රකාශය ලැබී දින 21 ක් තුළ බැංකුවට දැනුම්දිය යුතුය.

29. ප්‍රකාශනවල පිටපත් ආරක්ෂා කරගැනීම පිළිබඳව ගනුදෙනුකරු වගකිව යුතුය. ප්‍රකාශන පිටපත් බැංකුවෙන් ඉල්ලුම්කරන විට, මෙම සේවාව ලබාදීම සඳහා එහි ප්‍රකාශකර ඇති ගාස්තු  අනුව ගාස්තු අයකර ගැනීමට බැංකුවට අයිතිය ඇත.

30. බැංකුවේ අභිමතය පරිදි සිදු කරන්නේ නම් මිස, ගිණුමට මුදල් හෝ  චෙක්පත් තැන්පතු සිදු කර නොමැති නම් බැංකුව මඟින් තැපැල් මඟින් ඒ සඳහා වෙන් වෙන්ව උපදෙස් යවනු නොලැබේ.

31. ගනුදෙනුකරුගේ ලිපිනයේ යම් වෙනසක් සිදුවුවහොත් ඒ පිළිබඳව වහාම ලිඛිතව ගනුදෙනුකරු විසින් බැංකුවට දැනුම්දිය යුතුය.

32. මෙම නියමයන්  සහ කොන්දේසි යටතේ විශේෂිතව දක්වා නොමැති නම් NBIP ගිණුම යටතේ වන

ගනුදෙනුකරුගේ යම් අයිතීන් හෝ බැඳීම් ගනුදෙනුකරු විසින් පැවරීම හෝ මාරුකිරීම හෝ උකස් කිරීම සිදු නොකළ යුතු අතර එවැනි ගනුදෙනුවක් හේතුවෙන් සෘජුව හෝ වක්‍රව සිදුවන යම් පාඩුවක් පිළිබඳව බැංකුව බැඳී නොසිටින අතර ඒ පිළිබඳව වගකියනු නොලැබේ.

33. මෙහි සඳහන් කවර හෝ කරුණකට පටහැනිවීමකින් තොරව NBIP ගිණුම ගනුදෙනුකරුගේ වෙනත් කවර හෝ ගිණුමක් සමඟ හෝ බැංකුව සමඟ ගනුදෙනුකරුගේ ඇති වෙනත් යම් බැඳීමක්, සමඟ ඒකාබද්ධ කිරීමට එවැනි බැඳීමක් සත්‍ය හෝ අවිනිශ්චිත ,ප්‍රාථමික හෝ අතිරේක සහ එක්ව සහ වෙන් වෙන්ව වන වෙනත් කවර හෝ ගිණුමක් මත ගනුදෙනුකරුගෙන් බැංකුවට හිමි විය යුතු ඕනෑම මුදලක්/මුදල් වලට එරෙහිව NBIP ගිණුමේ හරව පවතින ඕනෑම මුදලක් /මුදල් හිලව් කිරීමට බැංකුව වෙත අධිකාරී බලය ලබාදීමට ගනුදෙනුකරු මින් එකඟ වේ.

34. ඕනෑම අවස්ථාවක තම අභිමතය පරිදි මෙම නියමයන් සහ කොන්දේසි වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට හෝ එකතු කිරීමට බැංකුවට අයිතියක් ඇති අතර එවැනි යම් වෙනස් කිරීමක්, සංශෝධනයක් හෝ එකතු කිරීමක් ගනුදෙනුකරු මත බැඳී පවතී. එවැනි වෙනස් කිරීම්, සංශෝධන සහ/හෝ එකතු කිරීම් පිළිබඳ දැන්වීම ගනුදෙනුකරුවෙත තැපෑලෙන් යැවීමට සහ / හෝ දේශීය මාධ්‍ය කටයුතු හරහා ලබා දීමට සහ/හෝ බැංකුවේ ශාඛාවල දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමට සහ/හෝ ගිණුම් ප්‍රකාශන හරහා යැවීමට හැකිය. තැපෑලෙන් යවන මෙහි ඇති ඕනෑම දැනුම්දීමක් ගනුදෙනුකරුගේ අවසන් වාර්තාගත ලිපිනයට තැපැල් කිරීමෙන් දින 7ක් ඇතුළත පාරිභෝගිකයාට ලැබුණු බවට සලකනු ලැබේ. එසේ ගනුදෙනුකරුට ලබා දෙන දැනුම්දීම ප්‍රමාණවත් සහ නිසි දැනුම්දීමක් ලෙස සලකනු ලබන අතර එය ගනුදෙනුකරු කෙරෙහි බැඳී පවතී.

35. නීති ප්‍රකාරව සංශෝධනය කිරීමට අවශ්‍ය වන්නේ නම් ,මෙම කොන්දේසි හා නියමයන් ස්වයංක්‍රීයවම සංශෝධනය වේ.

36. මෙම ලේඛනය සමාගමක් වෙනුවෙන් නොව, ව්‍යාපාර ආයතනයක හවුල්කරුවන් හෝ වෙනත් ආකාරයකින් පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් විසින් හෝ අත්සන් කර ඇත්නම්, මෙහි අඩංගු අධිකාරී බලයන් සහ වගකීම් එවැනි එක් එක් පුද්ගලයා විසින් එක්ව හා වෙන් වෙන් වශයෙන් ලබා දෙන බවට හෝ භාරගන්නා බවට උපකල්පනය කරනු ලැබේ.

37. අ) මෙම ලේඛනය තනි පුද්ගල ව්‍යවසායකයෙකු ලෙස අත්සන් කර ඇත්නම්, එම පුද්ගලයා තම ව්‍යාපාර ආයතනයේ සිදු විය හැකි යම් වෙනස්කම් පිළිබඳව බැංකුවට උපදෙස් දීමට මෙයින් භාර ගනී.

ආ) මෙම ලේඛනය ව්‍යාපාර ආයතනයක හවුල්කරුවන් ලෙස පුද්ගලයන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු විසින් අත්සන් කර ඇත්නම්, එවැනි එක් එක් පුද්ගලයා ඒකාබද්ධව සහ තනි තනිව ප්‍රකාශ කරන්නේ සහ භාරගනු ලබන්නේ:

i) එවැනි එක් එක් පුද්ගලයාට හවුල් ව්‍යාපාරය වෙනුවෙන් බැඳීසිටීමට සහ ඒ වෙනුවෙන් අත්සන් කිරීමට බලය ඇති අතර, එවැනි පුද්ගලයින් විසින් හවුල් ව්‍යාපාරය වෙනුවෙන් බැඳීසිටීමට සහ ඒ වෙනුවෙන් අත්සන් කිරීමට වෙනත් කවර හෝ පුද්ගලයෙකුට බලය පවරන බවට ලිඛිතව දැනුම් දෙන්නේ නම්, එවැනි පුද්ගලයන්ගෙන් කවර හෝ අයෙකුගෙන් ඊට පටහැනිව දැනුම්දීමක් ලැබෙන තුරු එවැනි අධිකාරියක් මත ක්‍රියා කිරීමට බැංකුවට හැකිය.

ii) කිසියම් හවුල්කරුවෙකුගේ මරණය හෝ විශ්‍රාම ගැනීමේදී, ජීවත්ව සිටින/අඛණ්ඩව සිටින හවුල්කරු (හවුල්කරුවන්) එවැනි මරණයක් හෝ විශ්‍රාම ගැන්වීමක් (අවස්ථාවෝචිතව) පිළිබඳව බැංකුවට ලිඛිත දැනුම්දීමක් සිදු කරනු ඇති අතර බැංකුවට එවන් දැනුම්දීමක් ලබාදෙන තෙක් හෝ මියගිය

හවුල්කරුගේ උරුමක්කාරයන් හෝ නීතිමය නියෝජිතයන් (අවස්ථාවෝචිතව) විසින් බැංකුවට ලිඛිත දැනුම්දීමක් කරන තුරු, ජීවත්වසිටින සිටින/අඛණ්ඩව සිටින හවුල්කරුවන්හට (අවස්ථාවෝචිතව) ව්‍යාපාර ආයතනයේ ව්‍යාපාර කරගෙන යාමට සහ එහි වත්කම් සමඟ ගනුදෙනු කිරීමට පූර්ණ බලය ඇති බැවින් ව්‍යාපාර ආයතනයේ කිසිදු වෙනසක් සිදු නොවූවාක් මෙන්,සැලකීමට බැංකුවට හිමිකම් ඇත.

Iii) කිසියම් හවුල්කරුවෙකු විසින් අනෙක් හවුල්කරුගේ (අනිත් හවුල්කරුවන්ගේ) අධිකාරිය අවසන් කර ඇති බවට බැංකුවට ලිඛිත දැනුම් දීමක් කරන අවස්ථාවකදී, බැංකුව විසින් මෙහි දැක්වෙන හෝ අන්‍යාකාරයක නියමයන් ප්‍රකාරව විවෘත කරන ලද ගිණුම් ක්‍රියාත්මක කිරීමෙහිලා එවැනි වෙනත් හවුල්කරුවන්ගේ අධිකාරිය ප්‍රතික්ෂේප කළ හැකි අතර

iv) ව්‍යාපාර ආයතනයට එක් කරගන්නා හවුල්කරුවන් පිළිබඳ තොරතුරු බැංකුව වෙත ලිඛිතව දැනුම්දිය යුතුය.

38. මෙහි අඩංගු නියමයන් සහ කොන්දේසි වලට අමතරව, බැංකුවේ ගිණුමක් විවෘත කිරීමට සහ/හෝ අයිරා පහසුකමක් ලබා ගැනීමට පෙර සියලුම ගනුදෙනුකරුවන් වෙත නිකුත් කරනු ලැබෙන බැංකුවේ පොදු ව්‍යාපාරික නියමයන් සහ කොන්දේසිවල ඇතුලත් කර ඇති නියමයන් සහ කොන්දේසිවලටද NBIP ගිණුම, ජංගම ගිණුම සහ අයිරා පහසුකම යටත්වන අතර ඒ සඳහා ගනුදෙනුකරුවන් බැඳී සිටියි. එවැනි නියමයන් සහ කොන්දේසි සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසිවලට ඇතුළත් කර තිබේද නැද්ද යන්න නොසලකා මෙහි අඩංගු සියලුම නියමයන් සහ කොන්දේසිවලට ගනුදෙනුකරු පූර්ණ හා සමාන වශයෙන් බැඳී සිටී.

39. මෙම නියමයන් සහ කොන්දේසී ශ්‍රී ලංකාවේ නීතින් මඟින් පාලනය වනු ඇත.

40. මෙහි අඩංගු නියමයන් සහ කොන්දේසි මා/අපි විසින් කියවා තේරුම්ගෙන ඒ මඟින් බැඳීසිටීමට එකඟ වෙමි/එකඟවෙමු.

**තනිපුද්ගල ව්‍යාපාරයේ, හවුල්කාරීත්වයේ /සමිතියේ/ සංවිධානයේ/ සංගමයේ /සමාගමේ නම :**
**(අදාළ නොවන දෑ කපා හරින්න)**

අත්සන :..............................
නම **:.....................................**
තනතුර .............................................................: (අදාළ වන්නේ නම්)
ජාතික හැඳුනුම්පත් අංකය: **.................................**
දිනය:......................................

අත්සන:..............................
**නම:.....................................**
තනතුර:.............................................................(අදාළ වන්නේ නම්)
ජාතික හැඳුනුම්පත් අංකය: **.................................**
දිනය:......................................

අත්සන:..............................
**නම:.....................................**
තනතුර:..............................................................(අදාළ වන්නේ නම්)
ජාතික හැඳුනුම්පත් අංකය: **..................................**
දිනය:......................................

අත්සන:..............................
**නම:.....................................**
තනතුර:..............................................................(අදාළ වන්නේ නම්)
ජාතික හැඳුනුම්පත් අංකය: **..................................**
දිනය:......................................